# බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය** : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව

**දිනය** : 2014-02-26

**වේලාව** : පෙ.ව. 10.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වයඃ**

| | | |
|---|---|---|
| 1. | ගරු සභාපති | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. | ගරු උප සභාපති | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 3. | නගර සභා ගරු මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා |
| 4. | නගර සභා ගරු මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. | නගර සභා ගරු මන්ත්‍රී | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 6. | නගර සභා ගරු මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 7. | නගර සභා ගරු මන්ත්‍රී | චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා |
| 8. | නගර සභා ගරු මන්ත්‍රී | එම්. ජේ. මලික්ෂා මැතිතුමා |

මෙවර මහා සභා රැස්වීම් වාරයට නගර සභා ගරු මන්ත්‍රී අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමා නොපැමිණෙන බව දන්වා තිබුණි.

**නිලධාරී සහභාගීත්වය**

1. ලේකම් එම්. එච්. සීලවතී මිය

## 01 ආගම සිහි කිරීමඃ

රැස්වීමට පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

## 02. පසුගිය සභා වාර්තාව සම්මත කිරීම

ගරු සභාපතිතුමන් විසින් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කරන ලද අතර, ගරු උප සභාපතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

කියැවූ ලෙස සලකා එම වාර්තාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 03. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන

මෙදින මහා සභා රැස්වීමට පැමිණ සිටි ගරු උප සභාපතිතුමන්, නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය සහ මාධ්‍යවේදීන් ඇතුළු සියළුම දෙනා ගරු සභාපතිතුමන් විසින් සාදරයෙන් පිළිගන්නා ලදී.

2012 වර්ෂයේ සබරගමුව පළාත් කාර්ය සාධන තරගයෙන් මෙම නගර සභාවට විශිෂ්ට ජයග්‍රහණ රැසක් ලබා ගැනීමට හැකියාව ලැබුණු බව ද, හොඳම නගර සභා අංශයෙන් පළමු ස්ථානය දිනාගත් අතර, මහජන පුස්තකාලය, කොම්පෝස්ට් ව්‍යාපෘතිය සහ මහජන පොල ද රත්නපුර දිස්ත්‍රික් ප්‍රථම ස්ථානය සහ සබරගමුව පළාත් ප්‍රථම ස්ථානයට හිමි රන් සම්මාන දිනා ගැනීමට සමත් වූ බව ද, නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව ලකුණු දශම පහකින් දෙවන ස්ථානය දිනා ගත් අතර, පෙර පාසැල දෙවන ස්ථානය ලබාගෙන ඇති බව ද ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට

දැනුම් දෙන ලදී. ඒ සඳහා දායක වූ සියලු දෙනාගේ පෞද්ගලික ලිපි ගොණු වලට ප්‍රශංසාත්මක ලිපි ඇතුළත් කිරීමට යෝජනා කරන බව ද එතුමන් සඳහන් කරන ලද අතර, සියලු දෙනාට සුභ දවසක් වේවායි ප්‍රාර්ථනා කරමින් මහා සභා රැස්වීමේ ඉදිරි කටයුතු අරඹන ලදී.

## 04. පසුගිය මහා සභා වාර්තාව සමාලෝචනය කිරීම

සභා වාර්තාවට සංශෝධන ඉදිරිපත් නොවීය.

## 05. පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම

පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණයන්හි ප්‍රගතිය හා කර්මාන්ත ප්‍රගතිය ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 06. සභාවට ලැබී ඇති ලිපි/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම

### 06:01 විශ්ව විද්‍යාල ශිෂ්‍යාධාර ලබා ගැනීම - අයෝමි ධුවිත්‍යා

අයෝමි ධුවිත්‍යා ක්‍රාවගේ ශිෂ්‍යාව මොරටුව විශ්ව විද්‍යාලයේ නගර සහ ග්‍රාම නිර්මාණ පාඨමාලාව හැදෑරීම සඳහා තෝරාගෙන ඇති බැවින් මෙම සභාවෙන් ලබා දෙනු ලබන ශිෂ්‍යත්වය සඳහා ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, එම ශිෂ්‍යාව අදාල ශිෂ්‍යත්වය ලබා දීම සඳහා තෝරා ගැනීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 06:02 විශ්ව විද්‍යාල ශිෂ්‍යාධාර ලබා ගැනීම - සඳුන් ජයනාත් කහංගම

කහන්ගමගේ සඳුන් ජයනාත් කහන්ගම ශිෂ්‍යයා ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය තෝරාගෙන ඇති බැවින් මෙම සභාවෙන් ලබා දෙනු ලබන ශිෂ්‍යත්වය සඳහා ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, එම ශිෂ්‍යයා අදාල ශිෂ්‍යත්වය ලබා දීම සඳහා තෝරා ගැනීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 06:03 හෝටලයක් පවත්වාගෙන යාම සඳහා අවසර ඉල්ලීම - බළන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය

බළන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතියට අයත්, බළන්ගොඩ කෙළින් වීදියේ ව. අ. 151 දරන ස්ථානයේ 'සමු රසහල' නමින් රසහලක් පවත්වාගෙන යාමට අවශ්‍ය අනුමැතිය ලබා දෙන මෙන් බළන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතියේ සාමාන්‍යාධිකාරී විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී

එම යෝජනාව නගර සභා ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:04 මාසික කුලී පදනම මත බස්නැවතුමේ ස්ථානයක් ලබා ගැනීම - නිම්නද රේඩියෝ**

දැනට සභා තීරණයක් මත බස් නැවතුම්පොල, පොලිස් මුරපොල පැවති ස්ථානයේ වසරක කාලයකට අය කිරීමකින් තොරව පවත්වාගෙන යනු ලබන නිම්නද රේඩියෝ ආයතනය මේ වන විට ක්‍රියාත්මක නොවන බැවින්, එම කාමරය රු. 5,000.00ක මාසික කුලී පදනම මත බලන්ගොඩ, බෝම්බුව, 56/781 ස්ථානයේ පදිංචි කේ. ඩී. කුමුදු සම්පත් යන අයටලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:05 වරිපනම් ගාස්තු නිදහස් කිරිම**

'සුසිරි', බුලත්ගම, බලන්ගොඩ යන ස්ථානයේ පදිංචි එස් ලියනගේ යන අයට අයත් ඉඩමේ පිහිටි නිවසේ වහලය කඩා වැටී ඇති බැවින්, එම ස්ථානයේ ඉඩම සඳහා පමණක් වරිපනම් ගාස්තු අය කරන මෙන් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:06 පරවියන් ගහණය හේතුවෙන් සිදුවී ඇති අපහසුතා - බස් නැවතුම්පොල උඩු මහලේ ව්‍යාපාරිකයන්**

බස් නැවතුම්පොල උඩු මහලේ පරවියන් ලැගුම් ගැනීම හේතුවෙන් සිදුව ඇති අපහසුතාවයන් පිළිබඳ එහි උඩු මහලේ ව්‍යාපාරිකයන් විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, එම ස්ථානය පරීක්ෂාකර බලා සුදුසු පියවර ගැනීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**16:07 හොටලයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ලබා ගැනීම - පී. එම්. යූ. එස්. එච්. කේ. වීරරත්න**

කල්තොට පාර, ෆලීල් හජ්ජියාර් මාවතේ, අංක 209/14 ස්ථානයේ හෝටලයක් පවත්වාගෙන යාම සඳහා අවසර ලබා දෙන මෙන් පී. එම්. යූ. එස්. එච්. කේ. වීරරත්න යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ද, මේ වන විට එහි සැලසුම් අනුමත කර ඇත්තේ නිවසක් සඳහා බව ද, එහි භාවිතය වෙනස් කිරීම සඳහා අනුමැතිය ලබා ගත් පසු අදාල නිර්ණායක සපුරා ඇතිදැයි පරීක්ෂා කර බලා එම ලැගුම්හල පවත්වාගෙන යාමට අවසරය ලබා දීමට ද ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:08 අංක සී 32 ඒ කඩකාමරය ඉල්ලීම - එම්. අයි. එම්. හිල්මි**

එස්. එම්. අජිත් කීර්තිනායක යන අය විසින් පවත්වාගෙන යනු ලැබූ, බස් නැවතුම්පොල අංක සී 32 කඩකාමරය ලබා දෙන මෙන් එම්. අයි. එම්. හිල්මි යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, අදාල ගාස්තු අයකර එම අය වෙත කඩ කාමරය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:09 2013 වර්ෂය සඳහා වැසිකිළි ආධාර ඉල්ලුම්කර ඇති අයගේ නාම ලේඛනය**

2013 වර්ෂය සඳහා වැසිකිළි ආධාර ඉල්ලුම් කරන ලද 21 දෙනෙකුගේ නාම ලේඛනය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, අදාල සුදුසුකම් පරීක්ෂාකර බලා අදාල ආධාර ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:10 2013 භාණ්ඩ සමීක්ෂණය**

2013 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, එහි 'S' අක්ෂරය යොදා ඇති භාණ්ඩ 2014.03.12 වන දින වෙන්දේසි කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:11 ඉඩම් තක්සේරු ලේඛනගත කිරීම**

කිරිඳිගල මැද පාරේ, තොසිල ගාර්ඩන් ඉඩමට යාබද ඉඩම් කොටස් වල පදිංචිව සිටින පහත නම් දැක්වෙන අයගේ ඉඩම් කොඉස් තක්සේරු ලේඛන ගත කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

- උපාලි අයිවන් - යෝජිත අංක 45/17
- නන්දසිරි - යෝජිත අංක 45/18
- සම්පත් - යෝජිත අංක 45/19
- නිපොන් සැලූන්- යෝජිත අංක 45/20

- රංජනී - යෝජිත අංක 45/21
- ධම්මික - යෝජිත අංක 45/22
- නෙල්සන් - යෝජිත අංක 45/23
  24, 25, 26, 27 අමතර
- චින්තක - යෝජිත අංක 45/9

එම යෝජනාව නගර සභා ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:12 2014 අලුත් අවුරුදු ප්‍රචාරක වැඩසටහන**

2014 සිංහල සහ හිංදු අලුත් අවුරුද්දේ ප්‍රචාරක කටයුතු කිරීම සඳහා නදීප් චමින්ද, කොවුල් හඬ සහ නාලක ජේ. හෙට්ටිආරච්චි යන අය විසින් ඉල්ලීම් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දෙන ලද අතර, මෙම සභාවේ ප්‍රචාරක කාර්යයන් සඳහා සහ උත්සව අවස්ථාවන්හි ශබ්ද විකාශන කටයුතු සඳහා අවශ්‍ය අවස්ථාවන්හි දී දායකත්වය සපයන නාලක ජේ. හෙට්ටිආරච්චි යන අයට කපිල ගුණසෝම යන අය සමග ඒකාබද්ධව අදාල විකාශන කටයුතු සඳහා අවසර ලබා දීමට ද, බලපත්‍ර ගාස්තු වශයෙන් රු. 1,000.00ක් අය කිරීමට හා රු. 25,000.00ක මුදලක් සභාවට අය කර ගැනීමට ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:13 මැටල්කොරි ඉඩමේ පදිංචිකරුවන් සම්බන්ධව**

මෙම සභාවට අයත් මැටල්කොරි ඉඩමේ කොටස් මැනීම් කටයුතු කර එහි පදිංචි පවුල් සඳහා ප්‍රමාණවත් ඉඩම් කොටස් වෙන් කර දී, පළාත් පාලන කොමසාරිස් අනුමැතියට යටත්ව බදු පදනම මත එක් පවුලකින් වර්ෂයකට රු. 3,000.00 බැගින් අය කිරීමට ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:14 2014 අලුත් අවුරුදු ප්‍රචාරක වැඩසටහන - එම්. නදීප් චමින්ද මයා**

යෝජනා අංක 06:13 යටතේ සාකච්ඡා කර තීරණයක් ගන්නා ලදී.

**06:15 2014 සිංහල අලුත් අවුරුදු උදාව වෙනුවෙන් 'කොවුල් හඬ' වෙළඳ ප්‍රචාරක සේවය සඳහා අවසර ඉල්ලීම**

යෝජනා අංක 06:13 යටතේ සාකච්ඡා කර තීරණයක් ගන්නා ලදී.

**06:16 මොහාන් එල්ලාවල සමාජ සංවර්ධන පදනම සඳහා ආධාර ලබා ගැනීම පිණිස සංවිධානය කරන සැණකෙළියට නගර සභා ක්‍රීඩා පිටිය වෙන් කරවා ගැනීම සම්බන්ධව**

මොහාන් එල්ලාවල සමාජ සංවර්ධන පදනම සඳහා ආධාර ලබා ගැනීම පිණිස සංවිධානය කරන සැණකෙළියට නගර සභා ක්‍රීඩා පිටිය 2014 අප්‍රේල් මස 02 වන දින සිට 06 වන දින දක්වා වෙන් කරවා ගැනීම සඳහා අවසර ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමන්

මහා සභාවට දැනුම් දුන් අතර, අවුරුදු සමයේ එය පැවැත්වීමෙන් නගරයේ වෙළෙන්දන්ට පාඩුවක් වන බැවින් ඒ සඳහා අවසර ලබා නොදීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:17 බළන්ගොඩ නගර සභා ක්‍රීඩාංගනය වෙළඳ ප්‍රදර්ශනයක් සඳහා වෙන් කර ගැනීම**

සත්යොවුන් පදනම අප්‍රේල් මාසයේ වෙළඳ ප්‍රදර්ශනයක් සඳහා ක්‍රීඩා පිටිය වෙන් කර දෙන මෙන් ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර, ඒ සඳහා ද අවසරය ලබා නොදීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:18 මහජන සෞඛ්‍ය පරීක්ෂක වාර්ෂික ස්ථාන මාරු**

මහජන සෞඛ්‍ය පරීක්ෂක වාර්ෂික ස්ථාන මාරු යටතේ එම්. ඒ. නිමල් ප්‍රේමතිලක මහතා හට ඕපනායක පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක වශයෙන් ස්ථාන මාරුවක් ලැබී ඇති බව ද, ඒ වෙනුවට කේ. එල්. එන්. අයි. වීරසේකර මහතා නගර සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක වශයෙන් අනුයුක්ත කිරීමට ද, මෙහි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනට සහාය ලබා ගැනීම සඳහා බළන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා යෙදවීම සිදු කරන බව මෙම නගර සභාවට ද පිටපත් සහිතව ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් වෙත පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් දන්වා ඇති බව ද ගරු සභාපතිතුමන් විසින් දැනුම් දෙන ලද අතර, මේ සම්බන්ධ සියලු පාර්ශවයන් ගෙන්වා 2014.03.04 වන දින සාකච්ඡාවක් පැවැත්වීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:19 හිඟ වරිපනම් බදු අය කිරීම - ආරියසේන ගුණරත්න මයා**

මෙම නගර සභාවේ හිඟ වරිපනම් අය කිරීමට හා කසළ ගාස්තුව අය කිරීමට තමන් හට ලබා දෙන මෙන් බළන්ගොඩ උඩකන්ද ප්‍රදේශයේ පදිංචි ආරියසේන ගුණරත්න යන අය ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, විශ්‍රාමික අයකු බැවින්, පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය මත 10% කොමිස් පදනම මත අදාල සේවය ලබා ගැනීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:20 කසළ බදු එකතු කිරීම**

යෝජනා අංක 06:19 යටතේ තීරණයක් ගන්නා ලදී.

**06:21 රථවාහන ටෙන්ඩර් ගාස්තු පිළිබඳව - තනුජා වීරපුර මිය**

2014 වර්ෂය සඳහා අප්‍රේල් මස අවුරුදු නිවාඩුව හා වෙසක්, පොසොන්, ඇසළ පෝය නිවාඩු වෙනුවෙන් ගාස්තු අයකිරීමකින් තොරව දින දහයක නිවාඩුවක් ලබා දෙන මෙන්

රථවාහන ටෙන්ඩරකරු වන තනුජා කුමාරි වීරපුර යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් මහා සභාවට දැනුම් දෙන ලදී. රථවාහන ගාස්තු අයකරන සීමාව පුළුල් කර දීමත්, ලංසු මුදල අඩු කිරීමත් නිසා ඉල්ලා ඇති දින 10 නිවාඩුව ලබා නොදීමට එතුමන් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:22 අප්‍රේල් මාසයේ වෙළඳ සේල් හෝ වෙළඳ සැණකෙළි සඳහා නගර සභා ක්‍රීඩා පිටිය නොදෙන ලෙස ඉල්ලීම - බළන්ගොඩ වෙළඳ සංගමය**

අප්‍රේල් මාසයේ වෙළඳ ප්‍රදර්ශන සහ වෙළඳ සැණකෙළි සඳහා නගර සභා ක්‍රීඩා පිටිය ලබා නොදෙන මෙන් බළන්ගොඩ වෙළඳ සංගමය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:23 ප්‍රචාරණ දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනයට අවසර ගැනීම - ඩබ්. නුවන් ප්‍රේමරත්න මයා**

එල් ඊ ඩී ප්‍රචාරක දැන්වීම් පුවරුවක් බස් නැවතුම්පොල ඉදිරිපිට සවි කිරීමට බළන්ගොඩ, කල්තොට පාර, 14/186 ස්ථානයේ පදිංචි ඩබ්. නුවන් චාමර ප්‍රේමරත්න යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දෙන ලද අතර, 2014 වර්ෂය සඳහා වර්ග අඩියකට රු. 500.00 බැගින් අය කර ඒ සඳහා අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:24 එල්. ඊ. ඩී. පුවරුවක් සවි කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම - තමාරා දමයන්ති මිය**

එල් ඊ ඩී ප්‍රචාරක දැන්වීම් පුවරුවක් බස් නැවතුම්පොල ඉදිරිපිට සවි කිරීමට තමාරා දමයන්ති යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දෙන ලද අතර, 2014 වර්ෂය සඳහා වර්ග අඩියකට රු. 500.00 බැගින් අය කර ඒ සඳහා අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:25 අවුරුදු උදාන - 2014 බළන්ගොඩ විශේෂ විකාශය - නාලක ජේ හෙට්ටිආරච්චි මයා**

යෝජනා අංක 06:13 යටතේ සාකච්ඡා කර තීරණයක් ගන්නා ලදී.

**06:26 ගිනි නිවීමේ ඒකකයට සේවකයන් බඳවා ගැනීම**

මෙම සභාවේ ගිනි නිවීමේ ඒකකය සඳහා අවශ්‍ය සේවයකයන් සතර දෙනෙකු බඳවා ගැනීමට ද, ගිනි ආරක්ෂණය වෙනුවෙන් ව්‍යාපාරිකයන් වෙතින් ගාස්තුවක් අය කිරීමටත්,

එක් එක් වෙළඳ සැලෙන් එක් සේවකයා බැගින් හා පොලිස් නිලධාරීන් ගිනි නිවීම සම්බන්ධව පුහුණු කිරීමටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:27 පළාත් පාලන නීතිය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව**

පළාත් පාලන නීතිය සම්බන්ධව පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය මගින් පවත්වනු ලබන සහතිකපත්‍ර පාඨමාලාම හැදෑරීම සඳහා මෙම සභාවේ නිලධාරීන් 11 දෙනෙකු ගේ නම් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලද අතර, එක් එක් නිලධාරියා වෙනුවෙන් පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් ඉල්ලා ඇති පරිදි රු. 15,000.00 බැගින් ගෙවීමටත්, ඒ සඳහා සහභාගී වන්නන් සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීමටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:28 2014.01.01 සිට 2014.02.23 දක්වා මාර්ග නඩත්තු සහ අලුත්වැඩියා විස්තර**

2014.01.01 සිට 2014.02.23 දක්වා මාර්ග නඩත්තු සහ අලුත්වැඩියා විස්තර ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:29 Expert Group Meeting on Risk and Resilience - Sendai, Japan සඳහා සහභාගී වීම**

2014.03.13 හා 14 යන දිනයන්හි ජපානයේ සෙන්දායි නගරයේ පැවැත්වීමට නියමිත Expert Group Meeting on Risk and Resilience සඳහා සහභාගී වීමට තමන් හට ආරාධනාවක් ලැබී ඇති බව ද, ඒ සඳහා සහභාගී වන එක් අයකු සඳහා ගුවන් ප්‍රවේශපත්‍ර ගාස්තු හා නවාතැන් පහසුකම් සංවිධායකයන් විසින් සපයන බව ද, සහභාගී වන අනෙක් අය එම වියදම් පෞද්ගලිකව දැරිය යුතු බව ද, ගරු සභාපතිතුමන් විසින් සඳහන් කරන ලදී. පෞද්ගලික විදේශ සංචාරයකට සහභාගී වීමට ඇති බැවින් ඒ සඳහා ගරු උප සභාපතිතුමන් සමඟ මහජන සෞඛ්‍ය පරීක්ෂක නිමල් ප්‍රේමතිලක මහතා සහභාගී කරවීමට ද, ඒ සඳහා ඔවුන්ට නිවාඩු අනුමත කරවා ගැනීමට ද එතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි ගරු සභාපතිතුමන් විසින් විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:30 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධ දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම**

ජපානයේ යොකොහාමා නගරයේ ජේ ඊ එස් සී ආයතනය විසින් ආසියාවේ නගර 04ක් තෝරාගෙන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධව දස අවුරුදු සැලැස්මක් ක්‍රියාවට නැංවීමේ මූලික සාකච්ඡාවේ දී මෙම සභාව ද ඒ සඳහා තෝරාගෙන ඇති අතර, ඒ සඳහා මූලික සූදානම් සපුරාලීමට විධිමත් දත්ත පද්ධතියක් අවශ්‍ය බැවින් දත්ත දිනපතා එකතු

කිරිමට පූර්ණ කාලීන සේවකයකු වශයෙන් සෞඛ්‍ය අංශයේ සේවයේ නියුතු අමිල ප්‍රසාද් යන අය යෙදවීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 07. රු. 10,000.00ට වැඩි මුදල් ගෙවීම් අනුමත කිරීම

සභා යෝජනා අංක **12:01** යටතේ සම්මත කරනු ලබන මුදල් කාරක සභා වාර්තාවට රු. 10,000.00ට වැඩි ගෙවීම් ඇතුළත් වේ.

## 08. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

මෙවර මහා සභාවට ඇස්තමේන්තු ඉදිරිපත් කර නොතිබුණි

## 09. ලංසු මිල ගණන් සලකා බැලීම

මෙවර මහා සභාවට ලංසු මිල ගණන් ඉදිරිපත් කර නොතිබිණි.

## 10. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්නඃ

මෙවර මහා සභාවට යථාපරිදි කල් දී ඇති ප්‍රශ්න ඉදිරිපත් කර නොතිබුණි

## 11. යෝජනා

### 11:01 ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා

11:01:01 ප්‍රධාන අමාත්‍යංශය විසින් ලබා දුන් ලොරි වැසිය සඳහා බවුසර ටැංකියක් ලබා ගැනීම

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර අවම ලංසුව වශයෙන් ඉදිරිපත් වූ රු. 675,000.00 සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාවන් ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් ඒවා මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 11:02 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා

11:01:01 තුඹගොඩ - බදුලුමාර්ගයේ බස්නැවතුම්පල අසල නාමපුවරුවක් සවි කිරීම
11:01:02 බුලත්ගම දෙමළ විදුහල මාර්ගය, වෙට්නෝල් මාර්ගය, සුදර්ශනගම ඉහළ මාර්ගය, පසුගිය සභා කිහිපයකදීම යෝජනා වුවත් ක්‍රියාත්මක නොවීම.
11:01:03 ජල ටැංකියට යන මාර්ගයේ බැම්ම බැඳීම පිළිබඳ අප නිතර දැනුවත් කළත් එයට අදාලව කටයුතු සිදු නොවීම.

ගරු උප සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනාවන් අතරින් 11:01:01 සිදුකිරීමට ද, ඉතිරි යෝජනාවන්හි සඳහන් කර්මාන්තයන් සම්බන්ධව කඩිනමින් කටයුතු කිරීමට ද මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාවන් ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එම යෝජනාවන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**11:03 නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා**

11:01:01 2014 මන්ත්‍රී ප්‍රතිපාදන මුදල් රු. 250,000.00න් අඩු ආදායම්ලාභීන් සඳහා සෙවිලි තහඩු ලබා දීම.
11:01:02 සරස්වතීවත්ත මාර්ගය කඩිනමින් සංවර්ධනය කිරීම
11:01:03 පල්ලෙකුඹුර මාර්ගය කැඩීගිය ස්ථාන පිළිසකර කිරීම
11:01:04 මහමෙව්නා මාවතේ කැඩී ඇති ස්ථාන පිළිසකර කිරීම
11:01:05 අක්කර 18 ප්‍රදේශයේ කැඩී ඇති කොටස් පිළිසකර කිරීම

නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනාවන්ට අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එම යෝජනාවන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**11:04 නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා**

11:01:01 අලාබ්දීන් මාවත පාර දෙපස ශුද්ධ පවිත්‍රකර අබලන් වී ඇති මාර්ගය අලුත්වැඩියා කිරීම
11:01:02 ගොරොක්ගහමඩ කිරිමණ්ඩලය ඉදිරියේ ඇති වටරවුම් පාර අලුත්වැඩියා කිරීම
11:01:03 උඩකන්ද පාරට විථි ලාම්පු දෙකක් සවි කිරීම
11:01:04 මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ඉදිරිපත් කරන යෝජනා

1. බළන්ගොඩ දෙහිගස්තලාව ක්‍රිස්තියානි පල්ලිය අසළ පාර අඩි 150ක් කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම.
2. දෙහිගස්තලාව, දෙවන පටුමග පාර අඩි 100ක් කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම.

නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනාවන් අතරින් 11:01:01, 11:01:02, 11:01:04 සඳහා අනුමැතිය ලබා දීමට ද, දැනට නව වීථි පහන් සවි නොකරන බැවින් ඒ 11:01:03 සම්බන්ධව ඉදිරියේ දී සලකා බැලීමට ද ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එම යෝජනාවන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 12. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

**12:01 මුදල් කාරක සභා වාර්තාව**

2014.02.21 වන දින පැවති මුදල් කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**12:02 තානායම් කාරක සභා වාර්තාව**

2014.02.21 වන දින පැවති තානායම් කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**12:03 කර්මාන්ත හා සංවර්ධන කාරක සභා වාර්තාව හා සංවර්ධන උපදේශන කාරක සභා වාර්තාව**

2014.02.24 වන දින පැවති කර්මාන්ත හා සංවර්ධන කාරක සභා වාර්තාව හා සංවර්ධන උපදේශන කාරක සභා රැස්වීම් වාර්තාවන් ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 13. ආදායම් වියදම් වාර්තා ඉදිරිපත් කිරීම

13:01 2014 ජනවාරි මාසය සඳහා වන ලැබීම් විග්‍රහය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 10,984,640.71 |
| වෙනත් ලැබීම් | 17,379,114.37 |
| **මුළු ලැබීම්** | **28,363,755.08** |
| පුනරාවර්තන වියදම් | 4,374,839.16 |
| වෙනත් වියදම් | 12,726,151.69 |
| **මුළු වියදම්** | **17,100,990.85** |

- බළන්ගොඩ තානායමේ 2014.01.01 වන දින සිට 2014.01.31 වන දිනයෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම එතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

ඉහත වාර්තාවන් සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් ඒවා මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**13:02 2014.01.01 සිට 2014.01.01 දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාව**

2014.01.01 සිට 2014.01.31 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී. අදාල කාලසීමාවට අදාලව වාහන සඳහා මුළු ඉන්ධන වියදම රු. 491,220.65 කි.

ඉහත ඉන්ධන වියදම් වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 14. වෙනත් කරුණු

**14:01 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා**

මෙවර පළාත් කාර්ය සාධන තරගයේ දී නගර සභාවේ සේවය අගයමින් ලද සම්මානයන් පිළිබඳව සතුටට පත් වන බව ද, පළාත් පාලන අංශයේ සියලුම විශයයන් අතරින් මෙම සභාව ඉදිරියෙන් සිටින බව ද, මෙම සභාවේ සේවය කර අත්දැකීම් ලද නිලධාරීන් සිටින වෙනත් පළාත් පාලන ආයතනයන්ට ද තරගාවලියේ ස්ථානයන් ලැබී තිබීම විශේෂයක් බවත් ගරු උප සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක එම්. ඒ. එන්. ප්‍රේමතිලක මහතා විසින් සිදු කර තිබෙන සේවය විශිෂ්ට බව ද, තම නිලයට අයත් සේවා කටයුතු ඉක්මවමින් නගර සභාව ඔසවා තැබීමට සිදු කරන කාර්යයන් ප්‍රශංසනීය බව ද, එතුමන් වෙත ලැබී ඇති ස්ථාන මාරුවෙන් එම කටයුතු අඩාල වන බව ද, ගරු උප සභාපතිතුමන් විසින් සඳහන් කරන ලදී.

කාර්ය සාධන තරගයේ දී ජයග්‍රහණ ලැබීමට ගරු සභාපතිතුමන් ඇතුළු මන්ත්‍රී මණ්ඩලය මෙන්ම නගර සභාවේ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය දක්වන ලද දායකත්වය අගය කළ යුතු බව ගරු උප සභාපතිතුමන් විසින් වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදී.

පළාත් පාලනය පිළිබඳව පසුගිය දිනවල පැවති පුහුණු වැඩසටහන් වල දී බොහෝ දේ දැන ගැනීමට ලැබුණු බව ද, ඉදිරියේ දී පැවැත්වෙන පුහුණු වැඩමුලු වලට සහභාගී වන මෙන් නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලාට ආරාධනා කරන බව ද එතුමන් සඳහන් කරන ලදී.

'සිරිපැරකුම්' චිත්‍රපටය ප්‍රදර්ශනය කිරීමේ දී අදාල විනෝද බද්දෙන් ලැබිය යුතු ආදායම ලබා නොගැනීම පිළිබඳව ගරු සභාපතිතුමන්ගෙන් විමසන බව ද, ගරු උප සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදී.

ඉඹුල්පෙ කොට්ඨාසයේ සේවය කරන වෛද්‍යවරයකු කාන්තාවන් උපත් පාලන සඳහා යොමු කිරීමට පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්ට උපදෙස් දෙන බව ද, එම සායනයට බලන්ගොඩ කළාපයේ ඇතැම් මුස්ලිම් කාන්තාවන් ද සහභාගී වන බව ද, එම වෛද්‍යවරයා ඔවුන්ට විශේෂ අවස්ථාවන් ලබා දී ප්‍රතිකාර කටයුතු කරන බව ද, එය අසාධාරණයක් බව ද ගරු උප සභාපතිතුමන් සඳහන් කරන ලදී. මෙවන් කටයුතු නිසා ජාතිවාදය හා ආගම්වාදය ඇතිවන බව ද, ඉදිරියේ දී අර්බුද ඇති කිරීමට එය හේතු වන බව ද එතුමන් ප්‍රකාශ කරන ලදී.

එක්සත් ජාතික පක්ෂ රජයක් මැතක දී බිහි වන බවක් පෙනෙන්නට නොතිබෙන නිසා මෙම නගර සභාවේ එම පක්ෂය නියෝජනය කරන නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලාට ද සේවය කිරීමට ඇත්තේ අයවැය ප්‍රතිපාදන මත ලැබෙන මුදල් පමණක් බැවින්, ඒවා ඔවුන්ට ලබා දීම කළ යුතු බව ද ගරු උප සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදී.

සියලුම ආගමික පූජ්‍ය/පූජක පක්ෂය සඳහා පුස්තකාලයේ සාමාජිකත්වය නොමිලේ ලබා දීම සුදුසු බවට තමන් යෝජනා කරන බව ද ගරු උප සභාපතිතුමන් සඳහන් කරන ලදී.

**14:02 නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා**

පළාත් පාලන සම්මාන උළෙලේ දී පළාතේ ඉහළම ස්ථානය බළන්ගොඩ නගර සභාවට ලැබීම සම්බන්ධව ඉමහත් සතුටට පත් වන බව ද, ගරු ප්‍රධාන අමාත්‍යතුමන් ද මෙම සභාවේ කටයුතු සම්බන්ධව ප්‍රශංසා සිදු කරන ලද බව ද, සියලු අංශයන්ගෙන් මෙම සභාවට මුල් තැන් ලබා ගැනීමට හැකි වූ බව ද, එය ප්‍රශංසනීය බව ද නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් සඳහන් කරන ලදී. මේ සම්බන්ධව ගරු සභාපතිතුමන් ලබා දුන් නායකත්වය සම්බන්ධව ද එතුමන් අදහස් දක්වන ලද අතර ඒ සඳහා සහයෝගය ලබා දුන් නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලාට ද, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයට ස්තුතිවන්ත වන බව ද සඳහන් කරන ලදී.

**14:03 නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා**

රට සංවර්ධනය වී ඇතත් ඒවාට යෙදවූ මුදල් නිසි පරිදි යෙදවා ඇති දැයි ප්‍රශ්නයක් වන බව ද, මත්තල ගුවන් තොටුපොල සහ හම්බන්තොට වරාය මේ වන තෙක් ජාත්‍යන්තර ගුවන් හා නාවික ගමනාගමන කටයුතු සඳහා ඇතුළත් නොවන බව ද සඳහන් කරන ලදී. අසාර්ථක වූ ව්‍යාපෘතිවල බර ජනතාවට ඇදීමට සිදුව තිබෙන බව ද, ඉදිරියේ දී ජනතාවට කරුණු වැටහී මෙම තත්ත්වයන් වෙනස් විය යුතු බව ද එතුමන් වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදී.

*මේ සම්බන්ධව අදහස් දක්වමින් ගරු උප සභාපතිතුමන් ප්‍රකාශ කළේ ඔවුන්ගේ පක්ෂයට ආණ්ඩුවක් පිහිටවීමට අවස්ථාවක් නොපෙනෙන බැවින් ප්‍රතිපාදන ලබා දිය යුතු බැව් යන්න පිළිබඳව බව සඳහන් කරන ලදී.*

**14:04 නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා**

සිංහල සහ හින්දු අලුත් අවුරුදු සමයේ වාහන තදබදය ගැටලුවක් විය හැකි බව ද, ඒ කාලය තුළ හෝ විශේෂ රථවාහන සැලැස්මක් ක්‍රියාත්මක කළ යුතු බව ද, වෙළඳසැල් ඉදිරිපිට ත්‍රීරෝද රථ හා යතුරු පැදි නවතා තැබීම සම්බන්ධව පියවරක් ගත යුතු බව ද, පොලිස් ස්ථානය ඉදිරිපිට බස්නැවතුම්පොල රථවාහන තදබදයට හේතුවක් බව ද, නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමන් විසින් සඳහන් කරන ලදී.

## 15. අවසානය

**ගරු සභාපති එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

මෙවර සභාවාරය සඳහා පැමිණි ගරු උප සභාපතිතුමන්, නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය හා ජනමාධ්‍යවේදීන් ඇතුළු සියලු දෙනාට ස්තුතිය පළ කරමින් ගරු සභාපතිතුමන් ප.ව. 12.00ට පමණ පමණ මහා සභා රැස්වීම අවසන් කරන ලදී.

ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.